**ශීර්ෂය 299 - ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය - 2025**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය **299** - ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2026 මැයි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජුනි 26 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ , මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරන ලදී.

**2.** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**3.** **මූල්‍ය සමාලෝචනය**

**3.1** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 1980 අප්‍රේල් 01 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 162 හි 6 ඡේදයේ II උප වගන්තිය | පෙ.ව. 9.00 ත් දහවල් 12.00 ත් අතර වේලාවක ප්‍රමාද වී පැමිණීම දින ½ ක නිවාඩුවක් සේ සැලකිය යුතුය යන්න සඳහන් වුවත් ඊට අනුකූල නොවී පෙ.ව.9.00 ඉක්මවා පැමිණි දින ½ ක නිවාඩුවක් අනුමත කර නොගත් නිලධාරින් 11 කගේ අවස්ථා 12 ක්ද පෙ.ව. 9.00 ට පසුව පැමිණි දින ½ ක නිවාඩුවක් අනුමත කර නොගෙන එම ප්‍රමාදය ආවරණය කර ඇති නිලධාරින් 11 කගේ අවස්ථා 25 ක් ද 2025 මැයි මාසයේදී පැවතුණි. | කාර්යාලයේ සියළුම නිලධාරින්ගේ නිවාඩු නැවත පරීක්ෂාකර නිවාඩු ලේඛන නිසි පරිදි යාවත්කාලින කිරිමට කටයුතු කර ඇති බව. 2026 වර්ෂයේ සිට ක්‍රමානුකූලව අදාළ චක්‍රලේඛ ප්‍රකාරව නිවාඩු ලේඛනය පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | නිවාඩු හා ප්‍රමාදවී පැමිණීම් සම්බන්ධව චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මැඩ්රිඩ් ව්‍යාපෘතිය යටතේ 2016, 2017 සහ 2020 වර්ෂවල මිළදීගත් පුටු 18 ක් , රූපවාහිනී යන්ත්‍රයක් හා T.V. Stand 01 ක් ලෙස එකතුව රු.586,587 ක් වූ වත්කම් මිළදීගත් දින සිට වසර 05 කට වැඩි කාලයක් භාවිතයෙන් තොරව ප්‍රධාන ගබඩාවේ තබා තිබුණි. | මෙහි සඳහන් kanteliver පුටු 2025 නොවැම්බර් 24 දින පේටන්ට් අංශය වෙත නිකුත් කර ඇති අතර ඉතිරි භාණ්ඩ අළුත් පරිශ්‍රයක් වෙත කාර්යාලය රැගෙන ගිය විට භාවිතයට ගැනීමට තබා ඇති බව. | මිළදීගෙන ඇති වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

### 4.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා වූ කාලපරිච්ඡේදයට අදාලව ඇඟිලි සළකුණු යන්ත්‍රයට අනුව මාසික පැමිණීමේ වාර්තා නියැදියක් නිවාඩු ලේඛනය සමඟ සැසඳීමේදී නිලධාරීන් 12 දෙනෙකු වරු නිවාඩු සටහන් කර නොතිබූ අවස්ථා 13ක් පැවතුණි. | 2023 මැයි 11 දින පැවති රැස්වීමකට අනුව සමාගම් මැදුර ගොඩනැගිල්ලේ එක් විදුලි සෝපානයක් ක්‍රියාවිරහිතව පැවතීම හා ඇඟිලි සලකුණු යන්ත්‍රය 03 වන මහලේ ස්ථාපිත කර තිබීම හේතුවෙන් පෙ.ව. 9.01 සිට පෙ.ව 9.05 දක්වා ප්‍රමාදවී පැමිණෙන නිලධාරීන් සඳහා සහනයක් ලෙස නිලධාරීන්ගේ පෞද්ගලික නිවාඩු අඩුකිරීමකින් තොරව පෙ.ව.8.31 සිට පෙ.ව. 9.05 දක්වා ප්‍රමාද කාලය ප.ව. 4.15 න් පසු ආවරණය කර යාම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අනුමැතිය ලබාදී ඇති බව. තවද කාර්යාලයේ සියළුම නිලධාරීන්ගේ නිවාඩු නැවත පරීක්ෂාකර නිවාඩු ලේඛන නිසි පරිදි යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇති බව. | නිවාඩු හා ප්‍රමාදවී පැමිණීම් සම්බන්ධයෙන් චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා වසර 05 ක කාලයක සිට අභ්‍යන්තර විගණකවරයෙක් පත්කර නොතිබුණි . | මෙම කාර්යාලයේ පුරප්පාඩුව පවතින අභ්‍යන්තර විගණක තනතුරේ වැඩ බැලීම සඳහා 2026 පෙබරවාරි 17 දින වාණිජ දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි පත්කර ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට පියවර ගත යුතුය. |

## 5.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුවක් පත් කර තිබුණද 2025 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | ආයතනයට ස්ථිර අභ්‍යන්තර විගණකවරයකු නොසිටීම ද ස්ථිර ගණකාධිකාරීවරයෙකු නොමැති වීම ද මත විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් පැවැත්විය නොහැකි වූ බව. | පනත ප්‍රකාරව මාස 03 කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය 110 ක් තථ්‍ය කාර්ය මණ්ඩලය 79 ක් හා පුරප්පාඩු සංඛ්‍යාව 31 ක් විය. එහිදී ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක් ද්විතීයික මට්ටමේ තනතුරු 18 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 07 ක් පුරප්පාඩුව පැවතුණි. අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 2025 ජුනි 28 දින සිට වැඩ බැලීමේ පත්වීමක් සිදුකර තිබූ අතර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර 2021 පෙබරවාරි 17 දින සිට පුරප්පාඩුව පැවතුණි. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු ලෙස අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා පරීක්ෂණ) යන දෙපාර්තමේන්තුගත තනතුරු පුරප්පාඩුව පවතී. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියකු බඳවා ගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරීම සඳහා බඳවා ගැනීමේ පටිපාටියේ කෙටුම්පත සකස් කර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |